**<u>මධ්‍යම පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ</u>**

**<u>උප ලේඛනගත තනතුරු සඳහා වූ ස්ථාන මාරු පරිපාටිය</u>**

මධ්‍යම පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුගත තනතුරු සඳහා වන මෙම ස්ථාන මාරු පරිපාටිය මධ්‍යම පළාතේ ගරු ආණ්ඩුකාර තුමා විසින් අනුමත කරනු ලබන දින සිට වලංගු වන අතර එදින සිට මධ්‍යම පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුගත තනතුරු වල නිලධාරීන් සඳහා මෙතෙක් ක්‍රියාත්මක වූ යම් ස්ථාන මාරු පරිපාටියක් වේ නම් ඒ සියල්ල මෙයින් අවලංගු වේ.

**01. ස්ථාන මාරු මණ්ඩලය**

ස්ථාන මාරු මණ්ඩල මධ්‍යම පළාතේ දේශීය වෛද්‍ය විෂය අයත් අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලබන අතර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ iii පරිච්ඡේදයේ 3 වගන්තියට අනුව කටයුතු කරනු ලැබේ. එම මණ්ඩල විසින් අයදුම්කරුවන් ඉදිරිපත් කරනු ලබන තොරතුරු මත 01 වන උපලේඛනයේ දක්වා ඇති ලකුණු පරිපාටියට අනුකූලව ලකුණු ලබා දෙනු ලැබේ. ස්ථාන මාරු ලබාදෙනු ලබන්නේ නිලධාරීන් ලබා ගන්නා ලකුණු ප්‍රමාණය මත වේ.

**02. ස්ථාන මාරු සඳහා ඉල්ලුම් කිරීම**

2.1 මෙම පරිපාටියේ 03.1.(අ) ඡේදයේ සුදුසුකම් ලබන නිලධාරීන් 02 වන උප ලේඛනයේ ආදර්ශ ආකෘතිය අනුව ස්ථාන මාරු ඉල්ලුම්පත් ආයතන ප්‍රධානියා වෙත සෑම වර්ෂයකම ජූනි 30 දිනට පෙර ඉදිරිපත් කළ යුතුය. අදාල ආයතන ප්‍රධානියා තමාට ලැබෙන එවැනි ඉල්ලුම්පත් සියල්ල 03 වන උප ලේඛනයේ සඳහන් ආකෘතිය අනුව සාරාංශ ගත කර තම නිර්දේශය සහිතව ජූලි 15 දින හෝ ඊට පෙර ලැබෙන සේ මධ්‍යම පළාතේ ආයුර්වේද කොමසාරිස් වෙත එවිය යුතුය. ඔහු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ iii පරිච්ඡේදයේ 6 වගන්තියට අනුව ඉදිරි කටයුතු සිදු කළ යුතුය. ස්ථාන මාරු පරිපාටිය ක්‍රියාත්මක කිරීමේදී අනුගමනය කළයුතු කාලසටහන පහත පරිදි වේ.

අගෝස්තු මස 15 දිනට පෙර - ස්ථාන මාරු ඉල්ලුම්පත්‍ර ලබා ගැනීම හා අවසන් කිරීම.
ඔක්තෝබර් මස 01 දිනට පෙර - යෝජිත ස්ථාන මාරු පිළිබඳ දැනුම් දීම.
ඔක්තෝබර් මස 15 දිනට පෙර - වාර්ෂික ස්ථාන මාරු පිළිබඳ අභියාචනා භාර ගැනීම.
නොවැම්බර් මස 01 දිනට පෙර - වාර්ෂික ස්ථාන මාරු නියෝග නිකුත් කිරීම.
ජනවාරි මස 01 දිනට පෙර - වාර්ෂික ස්ථාන මාරු කිරීම් බලාත්මක කිරීම.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2017 - 01 - 18 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්
2017/04/19

**2.2** ස්ථාන මාරු මණ්ඩලය විසින් ලකුණු ලබා දෙනුයේ අයදුම්කරුවන් විසින් අයදුම්පත්‍රයේ සපයා ඇති තොරතුරු මත වන අතර අයදුම්කරුවන් නිවැරදි තොරතුරු ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

**2.3** අසත්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම විනයානුකූලව දඬුවම් ලැබිය හැකි වරදකි. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. අසම්පූර්ණ හා අපැහැදිලි අයදුම්පත් ස්ථාන මාරු මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කල හැකිය.

**03.** ස්ථාන මාරුවීම් වලදී සලකා බැලිය යුතු පොදු ප්‍රතිපත්ති

**3.1** ඉල්ලුම්පත්‍ර කැඳවන දිනය වන විට ඃ

(අ) අති දුෂ්කර සේවා ස්ථානයක අවුරුදු දෙකක්, දුෂ්කර සේවා ස්ථානයක අවුරුදු තුනක් හා පහසු සේවා ස්ථානයක අවුරුදු පහක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සියළුම නිලධාරීන් ස්ථාන මාරුවීම් ඉල්ලා සිටීම සඳහා සුදුසුකම් ලබන අතර, කිසියම් සේවා ස්ථානයක අවුරුදු පහක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සියළුම නිලධාරීන් ස්ථාන මාරුවීම් වලට යටත් වේ.

(ආ) සේවා කාලය ගණනය කිරීමේදී යම් ආයතනයක අඛණ්ඩව හෝ ඛණ්ඩව සිදුකල සේවා කාලවල එකතුව මුළු සේවා කාලයක් ලෙස ගණන් ගනු ලැබේ.

**3.2** 3.1(අ) ඡේදය යටතට ගැනෙන නිලධාරියෙකු ස්ථාන මාරුවක් ඉල්ලා ඇති විටෙක, එකී සේවා ස්ථානයේ සේවය කරන වැඩිම සේවා කාලයක් සහිත නිලධාරියාගේ සිට සේවා කාලය අවරෝහණ පිළිවෙලින් 3.1(අ) ඡේදයේ අවශ්‍යතා සපුරන නිලධාරීන් පමණක් පිටතට මාරු කල හැකිය.

**3.3** පහසු සේවා ස්ථානයක හෝ කිහිපයක අඛණ්ඩව අවුරුදු පහකට වැඩි සේවා කාලයක් සහිත නිලධාරීන් ස්ථාන මාරුවීම් වලට යටත් වන බැවින් තමන් අනුයුක්ත වීමට කැමති ස්ථාන පහක් සඳහන් කරමින් 02 වන උපලේඛනයේ ආකෘතිය අනුව අයදුම් පත්‍රයක් ඉදිරිපත් කල යුතුය. එසේ ඉදිපත් කලහොත් එහි සඳහන් ස්ථානයකට මාරුවීමක් ලබාදීමට නොහැකි වුවහොත් මාරුවීම් මණ්ඩල වල අභිමතය පරිදි ඔවුන්ට වෙනත් සේවා ස්ථානයක් ලබා දෙනු ඇත.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2012-01-18 දින
අනුමත කරන ලදි
ආණ්ඩුකාර ලේකම්

**3.4** භාර්යාව හා ස්වාමි පුරුෂයා යන දෙදෙනාම රාජ්‍ය සේවයේ නියුක්ත අය නම් එම දෙදෙනාටම ඔවුන්ගේ ඉල්ලීම අනුව එකම ප්‍රදේශයක සේවය කිරීමට ඉඩ ලබා දීමට ස්ථාන මාරු මණ්ඩලය සෑම උත්සාහයක්ම දැරිය යුතුයි.

**3.5** නිලධාරියාගේ ඉල්ලීම මත හෝ වෙනත් විශේෂිත කරුණු මත මිස සාමාන්‍ය වශයෙන් වයස අවුරුදු පනස් තුන (53) ඉක්මවූ නිලධාරින් දිස්ත්‍රික්කයෙන් පිටතට මාරු නොකල යුතු වුවත්. නිලධාරියාගේ ස්ථිර පදිංචි ස්ථානයේ සිට කිලෝ මීටර් හතලිහක (40) සීමාව ඇතුලත හා දෙපාර්තමේන්තුවේ කටයුතු සඳහා නවක නිලධාරින් පුහුණු කරගැනීමේ අවශ්‍යතාවයන්ට යටත් වන්නේය.

**3.6** ආබාධිත දරුවන්, දීර්ඝ කාලීන අසනීප මත එක්තැන්ව සිටින කලත්‍රයන් වැනි නිලධාරින්ට මුහුණ දීමට සිදුවන විසඳාගත නොහැකි ගැටළු වලදී පිළිගත හැකි කරුණු සහිතව ආයතන ප්‍රධානියාගේ නිර්දේශයන්ද සමග ඉදිරිපත් කරන ඉල්ලීම පිළිබඳව සැලකිල්ලට ගෙන කටයුතු කරනු ලැබේ.

**3.7** යම්කිසි වෘත්තිය සමිතියක මව් සංගමයේ සභාපති/ලේකම්/භාණ්ඩාගාරික මාරු කරන්නේ නම් අදාල වෘත්තිය සංගමයේ ලේකම්ගේ නිර්දේශය සැලකිල්ලට ගත යුතු වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXV පරිච්ඡේදයේ 7 වගන්තිය යටතේ වන අනුග්‍රහයන් ලබා ගැනීමට අපේක්ෂා කරන සියළු වෘත්තිය සමිති තම වෘත්තිය සමිති නිලධාරින් පිළිබඳ විස්තර උක්ත ආයතන සංග්‍රහයේ XXV පරිච්ඡේදයේ 7.5 උප වගන්තිය ප්‍රකාර අදාළ මාරුවීම් බලධාරියා වෙත මාරුවීම් මණ්ඩල කටයුතු කිරීමට පෙර ඉදිරිපත් කල යුතු වේ.

**3.8** පහසු සේවා ස්ථාන වල සේවය කරන නිලධාරින් විසින් නැවත පහසු ස්ථානයකට කරනු ලබන මාරු ඉල්ලීම් සලකා බලනු ලබන්නේ එම සේවා ස්ථාන වලට දුෂ්කර/ අති දුෂ්කර සේවා ස්ථාන වල සේවය කරන නිලධාරින් විසින් කරනු ලබන ඉල්ලීම් සලකා බැලීමෙන් පසුවය.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2012 - 01 - 18 දින
අනුමත කරන ලදි.
ආණ්ඩුකාර ලේකම්

**04. සේවා ස්ථාන වර්ගීකරණය**

04 වන උපලේඛනයේ දක්වා ඇත. නමුත් නිලධාරියාගේ ස්ථිර පදිංචි ස්ථානයේ සිට කිලෝ මීටර් විසි පහක් (25) ඇතුලත වූ සේවා ස්ථාන ඔහුට පෞද්ගලික වන සේ පහසු සේවා ස්ථාන සේ සලකා කටයුතු කරනු ලැබේ.

**05.** ස්ථාන මාරුවීම් ලැබේ යැයි අපේක්ෂා කරන නිලධාරීන්ගේ රාජකාරි කටයුතු කල් ඇතිව වෙනත් නිලධාරීන්ට පුහුණු කර වාර්ෂික ස්ථාන මාරුවීම් නියමිත දිනට ක්‍රියාත්මක කරවීමට ආයතන ප්‍රධානීන් කටයුතු කළ යුතුය. මෙවැනි කරුණු සම්බන්ධයෙන් පසුව කෙරෙන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

**06.** අදාල වර්ෂයේ ස්ථාන මාරු ඉල්ලුම් පත් කැඳවීමෙන් පසු එම වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක වන තෙක් අන්‍යෝන්‍ය ස්ථාන මාරුවීම් සඳහා ඉල්ලුම් පත් භාර නොගත යුතුය. සේවා අවශ්‍යතා මත කළ යුතු ස්ථාන මාරුවීම් පමණක් එම කාලය තුළ කරනු ලැබේ.

**07. අභියාචනා මණ්ඩලය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ iii පරිච්ඡේදයේ 5 වගන්තියට අනුව අභියාචනා මණ්ඩල ක්‍රියාත්මක වේ. ස්ථාන මාරු නියෝගයන්ට විරුද්ධව කෙරෙන අභියාචනා සලකා බැලීම සඳහා අභියාචනා මණ්ඩල පිහිටුවා ඒ අනුව අවශ්‍ය කටයුතු කළ යුතුය.

**08. ස්ථාන මාරු සඳහා අනුමැතිය**

ස්ථාන මාරු මණ්ඩලයේ තීරණ හා අභියාචනා මණ්ඩලයේ තීරණ මධ්‍යම පළාතේ දේශීය වෛද්‍ය විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් මගින් අදාල ස්ථාන මාරුවීම් බලධාරියා වෙත ඉදිරිපත් කරනු ලබයි. ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කරනුයේ අදාල ස්ථාන මාරුවීම් බලධාරියාගේ අනුමැතිය ලැබීමෙන් පසුව හා ඔහු විසින් නියම කරණු ලබන දින සිටය.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2012-01-18 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

**01 වන උපලේඛනය**

**<u>මධ්‍යම පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ වාර්ෂික ස්ථාන මාරු සඳහා</u>**

**<u>ලකුණු පරිපාටිය</u>**

01 1. සේවා ස්ථාන වර්ගීකරණය කර ඇති හතර වන උප ලේඛනයේ අති දුෂ්කර යැයි සඳහන් කරන සේවා ස්ථානයක සේවය සඳහා වසර දෙකක සේවා කාලයකට ලකුණු තිහක්ද. ඊට වැඩිවන සෑම වර්ෂයකටම ලකුණු පහ බැගින් උපරිම ලකුණු හැටක් දක්වා දෙනු ලැබේ.

(උපරිම ලකුණු 60)

2. දුෂ්කර යැයි වර්ග කර ඇති සේවා ස්ථානයක අවුරුදු තුනක සේවා කාලයක් සඳහා ලකුණු තිහක්ද. ඊට වැඩිවන සෑම වර්ෂයකටම ලකුණු හතර බැගින් උපරිම ලකුණු පනහක් දක්වා දෙනු ලැබේ.

(උපරිම ලකුණු 50)

3. පාසල් යන දරුවන් වෙනුවෙන් එක් දරුවෙකුට ලකුණු පහ බැගින් උපරිම ලකුණු විස්සක් හිමිවේ.

(උපරිම ලකුණු 20)

4. නිලධාරියාගේ හා කලත්‍රයාගේ සේවා ස්ථානයක් අතර කිලෝ මීටර් හතලිහක් අසූවක් අතර නම් ලකුණු පහක්ද. කිලෝමීටර් අසූවට වැඩිවන සෑම කිලෝමීටර් පහලොවකටම ලකුණු දෙක බැගින් උපරිම ලකුණු දහයක් දක්වා ලබා දෙනු ලැබේ.

(උපරිම ලකුණු 10)

5. හතර වන උප ලේඛනයේ පහසු සේවා ස්ථානයට ඇති දුර කිලෝ මීටර් හතලිහත් අසූවත් අතර ලකුණු පහලවක්ද. ඊට වැඩිවන සෑම කිලෝ මීටර් පහලොවකටම ලකුණු දෙක බැගින් උපරිම ලකුණු තිහක් හිමි වේ. මෙම ලකුණු ප්‍රමාණය ලබා ගැනීමට අදාල සේවා ස්ථානයේ අවුරුදු තුනක අවම සේවා කාලයක් සම්පූර්ණ කල යුතුය. පහසු, දුෂ්කර හා අති දුෂ්කර සේවා කාලය වෙන් වෙන් වශයෙන් සලකා ලකුණු ප්‍රමාණය සකස් කරනු ඇත.

(උපරිම ලකුණු 30)

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019-01-18 දින
අනුමත කරන ලදි
ආණ්ඩුකාර ලේකම්

6. නිලධාරියාගේ හෝ නිලධාරියාගෙන් යැපෙන දෙමාපියන්ගේ හා දරුවන්ගේ රෝගී තත්ත්වයන් සඳහා ඉදිරිපත් කරන වෛද්‍ය හේතූන් සඳහා ලකුණු දහයක් ලබා දෙනු ඇත. (අභියාචනා මණ්ඩලයේදී වෛද්‍ය හේතූන් වෙනවෙනම සලකා බලනු ලැබේ)

(උපරිම ලකුණු 10)

02. ලකුණු ලබාදීමේ සාමාන්‍ය ක්‍රමය

01 ඉහත කී කරුණු සඳහා ලකුණු ලබාදීම මූලික වශයෙන් ස්ථානමාරු අයදුම්පතේ සඳහන් කරුණු අනුව සිදුකරනු ලබන අතර. එසේ ඉදිරිපත් කර ඇති කරුණු සාවද්‍ය බව අනාවරණය වුවහොත් අදාල නිලධාරියාට විරුද්ධව විනයානුකූලව කටයුතු කරනු ඇත.

02 වැඩිම ලකුණු ලබාගත් අනු පිළිවෙල අනුව නිලධාරින් ඉල්ලා ඇති ආයතනය වෙත ස්ථාන මාරු කිරීමට උත්සාහ කරනු ලැබේ.

03 ලකුණු ලබා දෙනුයේ ස්ථානමාරු අයදුම්පත් කැඳවන දිනයට පූර්වාසන්න වසර අටක කාලසීමාවක් සඳහා පමණි.

04 අති දුෂ්කර හෝ දුෂ්කර යැයි වර්ග කර ඇති සේවා ස්ථානයක තම ස්ථිර පදිංචි ස්ථානයට කිලෝ මීටර් විසි පහක් ඇතුලත පිහිටයි නම් එම නිලධාරින්ට පමණක් අදාල වන සේ පහසු සේවා ස්ථානයක් යැයි සලකනු ලැබේ.

05 නිලධාරින් දෙදෙනෙකු ලබා ගත් ලකුණු එක හා සමාන වුවහොත් නිලධාරින්ගේ ජ්‍යෙෂ්ඨත්වය සැලකිල්ලට ගනු ලබන අතර. වඩා ජ්‍යෙෂ්ඨ නිලධාරියාට ප්‍රමුඛත්වය ලැබේ.

02 වන උපලේඛනය

**මධ්‍යම පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ වාර්ෂික ස්ථාන මාරු සඳහා අයදුම් පත්‍රය**

01. සම්පූර්ණ නම :- ______________________

02. උපන් දිනය :- ______________ 12.31 දිනට වයස :- __________

03. මුල් පත්වීම් දිනය :- ______________

04. වර්තමාන සේවා ස්ථානය :- ______________________

05. වර්තමාන සේවා ස්ථානයේ රාජකාරියට වාර්තා කළ දිනය :- ______________

06. අ. ස්ථිර පදිංචි ලිපිනය :- ______________________

ආ. සේවා ස්ථානයේ සිට ස්ථිර පදිංචි ස්ථානයට ඇති දුර (කි.මී.) :- ______________

07. විවාහක නම

අ. කලත්‍රයාගේ රැකියාව :- ______________________

ආ. කලත්‍රයාගේ සේවා ස්ථානය හා ලිපිනය :- ______________________

ඇ. කලත්‍රයාගේ සේවා ස්ථානයේ සිට ඔබගේ සේවා ස්ථානයට ඇති දුර (කි.මී.) :- __________

ඇ. පාසැල් යන ළමයින් පිළිබඳ විස්තරය :- ______________________

| නම | ශ්‍රේණිය | පාසලේ නම හා ලිපිනය |
|---|---|---|
| | | |
| | | |

08. පූර්ව සේවා ස්ථාන :-

| සේවා ස්ථානය | සිට | දක්වා | සේවා ස්ථාන වර්ගීකරණය | | |
|---|---|---|---|---|---|
| | | | අති දුෂ්කර | දුෂ්කර | පහසු |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2012 - 01 - 18 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

09. ස්ථාන මාරු ඉල්ලුම් කරන සේවා ස්ථාන : -

1. ______________________

2. ______________________

3. ______________________

4. ______________________

5. ______________________

10. ස්ථානමාරු ඉල්ලුම් කිරීමට හේතු : -

______________________________________________

______________________________________________

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

______________________

නිලධාරියාගේ/නිලධාරිනියගේ අත්සන

ආයතන ප්‍රධානියාගේ නිර්දේශය : -

මෙම නිලධාරියා / නිලධාරිනිය මෙම ස්ථානයට මාරු කර ඇත්තේ ඔහුගේ / ඇයගේ ඉල්ලීම මතය / විනය හේතු මතය. මෙම නිලධාරියා / නිලධාරිනිය සම්බන්ධයෙන් විනය පරීක්ෂණයක් ආරම්භ කර ඇත / නැත. ඔහු / ඇය අනුප්‍රාප්තිකයකු සහිතව / රහිතව නිදහස් කල හැක. ඉහත දක්වා ඇති තොරතුරු නිවැරදි බවට සහතික කරමි.

දිනය : - ______________________

______________________

ආයතන ප්‍රධානියාගේ අත්සන හා
නිල මුද්‍රාව

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2012-01-18 දින
අනුමත කරන ලදි
ආණ්ඩුකාර ලේකම

**03 වන උපලේඛනය**

**<u>මධ්‍යම පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ වාර්ෂික ස්ථාන මාරු සඳහා අයදුම් පත් උප ලේඛනය</u>**

ආයතනය : - ..............................................................................

| නිලධාරියාගේ / නිලධාරිණියගේ නම | උපත් දිනය | විවාහක / අවිවාහක බව සහ කලත්‍රයාගේ සේවා ස්ථානය | පාසැල් යන දරුවන් පිළිබඳ විස්තර | සේවා ස්ථාන සහ කාලසීමාව | මාරු ඉල්ලීමට හේතු | මාරු වීමට කැමති ස්ථාන |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

දිනය : - ..............................

..................................................

ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2012-01-18 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

20 JAN 2012

04 වන උපලේඛනය

**මධ්‍යම පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ වාර්ෂික ස්ථාන මාරු සඳහා අයදුම් පත් උප ලේඛනය**

| අනු අංකය | ආයතනය | සේවා ස්ථාන වර්ගීකරණය | | |
|---|---|---|---|---|
| | | පහසු | දුෂ්කර | අති දුෂ්කර |
| 01 | ආයුර්වේද කොමසාරිස් කාර්යාලය | ✓ | | |
| 02 | පල්ලේකැලේ ආයුර්වේද රෝහල | ✓ | | |
| 03 | පළාත් ඖෂධ නිෂ්පාදනාගාරය | ✓ | | |
| 04 | පන්විල ආයුර්වේද රෝහල | ✓ | | |
| 05 | ගෙලිඔය ආයුර්වේද රෝහල | ✓ | | |
| 06 | දොළුව ආයුර්වේද රෝහල | ✓ | | |
| 07 | හඳගනාව ආයුර්වේද රෝහල | | ✓ | |
| 08 | තැන්න ආයුර්වේද රෝහල | ✓ | | |
| 09 | උතුරු මාතලේ ආයුර්වේද රෝහල | ✓ | | |
| 10 | තිල්දණ්ඩාහින්න ආයුර්වේද රෝහල | | ✓ | |
| 11 | කොත්මලේ ආයුර්වේද රෝහල | | ✓ | |
| 12 | උඩිස්පත්තුව මධ්‍යම බෙහෙත් ශාලාව | | ✓ | |
| 13 | නාවලපිටිය මධ්‍යම බෙහෙත් ශාලාව | ✓ | | |
| 14 | හතරලියද්ද මධ්‍යම බෙහෙත් ශාලාව | | ✓ | |
| 15 | අඩිකාරිගම මධ්‍යම බෙහෙත් ශාලාව | | ✓ | |
| 16 | උල්ලදුපිටිය මධ්‍යම බෙහෙත් ශාලාව | | ✓ | |
| 17 | ගලේවෙල මධ්‍යම බෙහෙත් ශාලාව | | ✓ | |
| 18 | බෝපිටිය මධ්‍යම බෙහෙත් ශාලාව | | | ✓ |
| 19 | පාරදෙක මධ්‍යම බෙහෙත් ශාලාව | ✓ | | |
| 20 | යටවර මධ්‍යම බෙහෙත් ශාලාව | ✓ | | |
| 21 | අලවතුගොඩ මධ්‍යම බෙහෙත් ශාලාව | ✓ | | |
| 22 | නුගේතැන්න මධ්‍යම බෙහෙත් ශාලාව | | ✓ | |
| 23 | දොරකුඹුර මධ්‍යම බෙහෙත් ශාලාව | | ✓ | |
| 24 | විල්ගමුව මධ්‍යම බෙහෙත් ශාලාව | | | ✓ |
| 25 | දඹුල්ල මධ්‍යම බෙහෙත් ශාලාව | ✓ | | |
| 26 | අංකුඹුර මධ්‍යම බෙහෙත් ශාලාව | | ✓ | |
| 27 | උඩමාදුර මධ්‍යම බෙහෙත් ශාලාව | | | ✓ |
| 28 | උඩපතේ මධ්‍යම බෙහෙත් ශාලාව | | | ✓ |
| 29 | ලග්ගල මධ්‍යම බෙහෙත් ශාලාව | | | ✓ |
| 30 | ගලගෙදර ජංගම බෙහෙත් ශාලාව | | ✓ | |
| 31 | මාරතුගොඩ ජංගම බෙහෙත් ශාලාව | | ✓ | |

ආණ්ඩුකාරතුමා විසින්
2012.01.18 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම

**05 වන උපලේඛනය**

**<u>මධ්‍යම පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ වාර්ෂික ස්ථාන මාරු සඳහා</u>**
**<u>දෙපාර්තමේන්තුගත නිලධාරීන්ගේ / සේවකයන්ගේ විස්තර</u>**

| අනු අංකය | තනතුර |
|---|---|
| 01 | සුළු සේවා පරිපාලක |
| 02 | සාමාන්‍ය කම්කරු |
| 03 | සනීපාරක්ෂක කම්කරු |
| 04 | ඖෂධාල කම්කරු |
| 05 | විමර්ශණ නිලධාරි (ආයුර්වේද) |
| 06 | හෙද නිලධාරි |
| 07 | ඖෂධ සංයෝජක |
| 08 | භෛසජ්ජක |
| 09 | උපස්ථායක |
| 10 | හෙද සොයුරිය |
| 11 | රසායනාගාර ශිල්පි |
| 12 | ආහාර නිරීක්ෂිකා |
| 13 | සම්භාහනකරු |
| 14 | රසායනාගාර සහායක |
| 15 | ලේඛණ භාරකරු |
| 16 | තාක්ෂණ සේවය |
| 17 | යන්ත්‍ර ක්‍රියාකරු |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2012-01-18 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

2012-01-03 දිනැති කොමිෂන් සභා රැස්වීම් දිනයේදී කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

| | නම | අත්සන |
|---|---|---|
| 1. | එස්. බී බැද්දේවෙල මහතා. (සභාපති) | |
| 2. | යූ. ඒ බෝගහපිටිය මහතා. (සාමාජික) | |
| 3. | ටී. වී මාරිමුත්තු මහතා. (සාමාජික) | |
| 4. | ඒ. එම්. ඒ ගෆූර් මහතා. (සාමාජික) | |
| 5. | පී.පී.එස්.ඒ. දිසානායක මහත්මිය (සාමාජික) | |

අනුමත කරමි / ප්‍රතික්ෂේප කරමි.

පිකිරි කොබ්බෑකඩුව
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර
2012..01..18